සමාජයක් ලෙසින් අප භාවිතා කරනා භාෂාව, සමාජයේ චින්තනය හැඩගස්වන බව අප මීන් පෙරද සාකච්ඡාවට ගෙන ඇති කරුණකි. එහිදී ගර්හාත්මක, කොන් කරනා සුළු යෙදුම් සම්බන්ධයෙන් මෙන්ම, වර්තමානයේදී පසුගාමී සංඥාවන් ලබාදෙන යෙදුම් සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතු වේ. තවමත් ඇතැම් විට පුවත්පත් තුළ දක්නට ලැබෙන "හාම්පුතා" යන යෙදුම ඊට උදාහරණයකි.

හාම්පුතා යන යෙදුම ඔස්සේ අතීතයේ නියෝජනය වී ඇති සමාජ සම්බන්ධතාවය වර්තමානය වන විට වෘත්තිමය සම්බන්ධතාවයක් දක්වා වෙනස් වී තිබෙනා බව කිව යුතුවේ. වර්තමානයේදී දක්නට ලැබෙනා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවය හා සසඳා බලන විට, හාම්පුතා යන යෙදුම ඔස්සේ වඩාත් පසුගාමී ස්වාමි-සේවක සම්බන්ධතාවයක් ඉදිරිපත් වෙයි. අතීතයේ 'ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය' ලෙසින් වූ ආයතන නාමය පවා වර්තමානයේදී 'ලංකා සේව්‍ය සම්මේලනය' බවට වෙනස්ව තිබීම, හාම්පුතා වැනි යෙදුම් වර්තමානයට නොගැලපෙන බවට නිදර්ශනයක් ලෙසින් ගත හැක. එසේ නම්, මාධ්‍ය මගින් 'හාම්පුතා' වැනි යෙදුම් වෙනුවට වඩාත් වර්තමානයට ගැලපෙන පරිදි සේවායෝජක, සේව්‍ය වැනි යෙදුම් යොදාගැනීම උචිත නොවන්නේදැයි විමසිය යුතු වේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #SathiAgaAruna